1978-12-15

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 6 දරන
# ආයුර්වේද (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 දෙසැම්බර් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 15 යි. | තැපැල් ගාස්තුව : ශත 25 යි.

**1978 අංක 6 දරන ආයුර්වේද (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 36/78

**1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1978 අංක 6 දරන ආයුර්වේද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1962 අංක 5 දරන පනතින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 82 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ආයුර්වේද පනතේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) තෝරා පත්කර ගැනීම සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන්ගෙන් තැන්පත් මුදල් ලබා ගැනීම සහ අපේක්ෂකයකු විසින් ලබා ඇති ඡන්ද සංඛ්‍යාව, ඡන්ද විමසීමක දී දෙනු ලැබූ සම්පූර්ණ ඡන්ද සංඛ්‍යාවෙන් නියෝගවල දක්වනු ලැබිය හැකි යම් අනුපාතයකට අඩුවන අවස්ථාවක ඒ අපේක්ෂකයා විසින් තැන්පත් කරන ලද මුදල රාජ සන්තක කිරීම ඇතුළුව, ආයුර්වේද වෛද්‍ය සභාව හෝ ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය සංයුක්ත කිරීමේ හෝ එකී සභාවේ හෝ මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේ කාර්ය සඳහා අවශ්‍යවන්නා වූ ඡන්ද විමසීම පැවැත්වීම ;".

37010—12,426 (78/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 ආ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. (1962 අංක 24 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 12ආ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මව්කිරි දෙන මව්වරුන් සඳහා මව්කිරි දීමේ විවේක කාල සැලසීම.

12 ආ. යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවකු වයස එක් අවුරුද්දකට අඩු දරුවකුට මව්කිරි දෙන්නේ නම් පැය නමයක කාලයක දී, ඇයට අවශ්‍ය පරිදි යම් වේලාවන්හි දී, මව්කිරි දීමේ විවේක කාල දෙකක් සඳහා සේවායෝජක විසින් ඉඩ දිය යුතු ය. ඒ දරුවාට කිරි දීම සඳහා ඒ කම් කරුවාට ඒ සේවායෝජක විසින් දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් සලසා ඇති අවස්ථා වක එක් එක් විවේක කාලය විනාඩි තිහකට නො අඩු විය යුතු අතර, දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් එසේ සලසා නොමැති අවස්ථා වක, එක් එක් විවේක කාලය එක් පැයකට නො අඩු විය යුතු ය. තව ද, එය යම් ලිඛිත නීතියක් යටතේ එම කම්කරුවාට ආහාර හෝ විවේකය සඳහා සලසන ලද යම් විවේක කාලයකට අතිරේකව විය යුතු අතර ඇගේ සේවානියුක්තියේ කාර්ය සඳහා ඒ කාලය ඇගේ සේවානියුක්තියෙහි ඇය වැඩ කළ කාලය වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) සහ (1අ) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) කොමසාරිස්වරයාට හෝ යම් විශේෂ නිලධරයකුට—

(අ) මේ ආඥාපනතේ විධිවිධාන පිළිපදිනු ලබන්නේදැයි නිශ්චය කිරීමේ කාර්ය සඳහා යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් ස්ථානයකට හෝ තැනකට දවාලේ හෝ රාත්‍රියේ සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළු වීමට සහ පරීක්ෂා කිරීමට;

(ආ) යම් නියෝගයක් මගින් එම කම්කරුවන්ගේ සේවායෝජක විසින් පවත්වා ගෙන යාමට නියම කරනු ලැබූ ගැහැණු කම්කරුවන් පිළිබඳ යම් ලේඛනයක් පරීක්ෂා කිරීමට;

(ඇ) ඒ තැන හෝ ස්ථානය පරීක්ෂා කරනු ලබන වේලාවේ දී, එහි යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා ලබා ගත නොහැකි අවස්ථාවක, තම කාර්යාලයේ දී හෝ ඒ තැන හෝ ස්ථානයේ දී ඒ ලේඛනය ඉදිරිපත් කිරීමට නියම කිරීමට; සහ

(ඈ) ඒ තැන හෝ ස්ථානයෙහි ඔහුට දක්නට ලැබෙන සහ එහි කර ගෙන යනු ලබන කර්මාන්තයක